

## රන්වන් Wattle මල
ආචාර්ය තරංග දන්දෙණිය

ඇන්ටාර්ක්ටික් හීතල
හූ කියන හුළඟත් එක්ක
යනවිට නගර ගම් බිම්
වකුටු කොට ඉස්මුදුන් පතුලට

පොරවන් සිටි පත්‍ර
සළුපිලි උනා දෙපතුල් යට
සිසිරයට විළියෙන්
වෙව්ලනා ලඳු පඳුරු මැද
කොළ හැලුන අතුකිනිති පුරා
ඇවිත් සැරසී රන්වනට
හිනැහෙයි පොකුරු යායට
පුංචි කහ මල්
නරුම වින්ටරය හරිමැද

අළු අඳුරු සැඳෑවක
දවටා ඉසපය තුන්පටක
සිනා අඩුව සිටින විට
කිම්දෙමින් මෑදුව සම විනිවිද
උණුසුම සදන හිරු එළිය හෙට
නුවරුනට සිහි කැන්දන

ලඟින් ඉන්නා හිරු එලිය යට
සිය දහස් කුසුම් ගණ මැද
සුවඳ දෙන වසන්තේ
වසාසිටි පිලි
එකින් එක හලන
සිහින වඩන
රන්වන් රන් මල



## කොහේද කොහේද අපේ ලොවක්
ජනක කුඹුකගේ

සුව සිහින බුදින
මැදියම රැගෙන එන
නිහඬ හඬ සිඹින
තත්පර දුවන ඇසිල්ලේ....

ගුවන් මග පාව ආ
ගිනි උන්ඩ වරුසාව
තරුකැට මුගුරු සේ පතිතව්ය
මහපොලව දෙදරවා ගිනිබත්ව....

තැන තැන ඇදහැලුනු
කිරි කැටියන්ගෙ විසුරුණු
ලේ ධාතුවෙන් තෙත්වුනු
මස් වැදලි මෙන් සිරුරු....

බ්‍රාන්තයෙන් මුසපත්ව
මිනිස් කැළ දුවති
හිස් ලු ලු අත....

ලොකු කුඩා බේදයෙන් තොර
හමා ආ උන්ඩ වරුසා හීසර
සිදුරු කර ඇත
මිහිකතේ ආත්මීය හද....

දුන් පින් අනුහසින්
තිස්තුන් කෝටියක් දෙවියන්
අහස් වියනේ සිටන්
නැරඹුවා මේ දසුන්....

පුරාතන ඉතිහාස පොත් ඉරන්
සපැමිණි මහා ඇලෙක්සැන්ඩර් තුමන්
ප්‍රන්ස අධිරද ලෙසින්
ගොඩබට නැපෝලියන් උතුමන්
සහ සම්බෝග යෝනියෙන්
වැදුවාය ....
හිට්ලර් නැමති සුකුමාල කුමරුන්....

වැඩිවිය පැමිනි මේ පුත් රුවන
ආල මවමින්
ලොවෙහි නන් දෙස
හනි හනික ජාතක කලා
ජවාධික යුධ අශ්වයකු
මනු ඇට මිදුළු
පත අට එකට සිඳ....

සුදෝ සුදු පරවියන් මැද
පියා සලමින් ඉගිල ගිය
යුධ අශ්වයා...
කන්ථක ද පරදා නේරන්ජනා පැන
අර්ධද්වීප මහද්වීප ද පසුකලා
නොතකා නොබලා
මායිම් වැට කඩුලූ....

එතැන් සිට මෙතැන්
ලොව කරමතින් ගත් උතුමන්
මහ බලවතුන් යයි අගතැන්
පෝෂනය කලා මිහිතලය
පුන්චි හිට්ලර් පැටව් මෙන්....

උරෙන් උර ගැටෙමින්
මුලූ වැර එකට යොදමින්
දුන් පා පහරවල් සොඳින්
පෙරලි පෙරලී පෘථිවි ගෝලය
ගියේ පිටපලූ ගැලවෙමින්....

ගිනිගත් මිහිකත
දවා අළු විය
මැදියමේ නිහඬ හඬ
තනිකම දරා ඉතිරි විය....

මිහිතලය පුපුරා
ගැලු සෙනෙහසේ ලාවා
නිසොල්මන් කලා
මේ පෘථිවි ධාරා....

ලෝකය තනි යායක්
ජීව හරණය කෙරූ
මළ යායක්....
එක මිටට ගොනුකෙරූ
මළ පොතේ මළ යායක්....

"කොහේද කොහේද අපේ ලොවක්
කොහේද කොහේද අපේ රටක්"
ගීයක ඇහුනා එහෙම හඬක්....

## අපේ ගම
එදා සහ අද

### එදා ගම

| | |
|---|---|
| එදා අපේ ගම්මානයෙ | පරිසරය |
| සිහියට නැගේ එය එතරම් | සුන්දරය |
| මතකය අවදි කරවන ඒ | විස්තරය |
| සටහන් කරන්ට සිතුනේ මේ | ලෙසය |
| | |
| සැවොල් හඬින් ගම උදයේ | පිබිදුනිය |
| නෙක සියොතුන් නදට සැම සිත් | සැනසුනිය |
| විසිතුරු වන මලින් මුලු ගම සුවඳ | විය |
| මේ පරිසරෙන් සැම හදවත් පුබුදු | විය |
| | |
| පෙන කැටි නගා ගෙන ඇල දොල ගලා | ගියා |
| ඒ සිසිලෙන් ගම්මානය නැහැවී | ගියා |
| එදියෙන් ගහ කොලද ගොයමද සරුව | ගියා |
| ගම්මානය සවුසිරියෙන් බැබලි | ගියා |
| | |
| මාදං හිඹටු බෝවිටියා හා | මොර ද |
| ඇටඹ ගිරඹ මීඅඹ හා රට | අඹ ද |
| බෙරලිය හා හල් ද මේ ආදී | දේද |
| දුන්නා ගමට රස අහරද පල | වැලද |
| | |
| මහනෙල් ඕලු කෙකටිය මල් දියෙහි | පිපී |
| රුක්කත්තන එරබදු මල් ලන්දෙ | පිපී |
| මී මැස්සන්ද සමගින් ආ රොනට | ඇදී |
| ලස්සන කලා ගම්මානය සුවඳ | දිදී |
| | |
| ලපටි ගොයම් මඳ සුලගේ නැලවී | ගියා |
| සමනල රංචු ගම හරහා පියඹ | ගියා |
| රෑන ගිරව් රන් ගොයමේ උඩින් | ගියා |
| ගම්මානය රූසිරියෙන් ඇලලි | ගියා |
| | |
| පැසුනු ගොයම් කෙත් ගන රන් පලස් | වැනී |
| තල හා කුරක්කන් හේනුත් එමට | වුනී |
| මේවායින් හොඳ හැටි අටු කොටු | පිරුනී |
| අගහිඟ කිසිත් කිසිවෙකුටත් නොම | දනුනී |
| | |
| කිරි අම්මා වරු නැති ගෙදරක් | නොවුනී |
| රස ගුන කිරෙන් නම් කිසි අඩුවක් | නොවුනී |
| ඒ කිරි වලින් සැමගේ නැණ බල | වැඩුනී |
| ගම්මානයෙ තව තව නැන මල් | පිපුනී |
| | |
| අඹ දඹ නාරන්ද වෙරලුද කජු | ගස්ද |
| කොස් දෙල් කෙසල් සමගින් නෙක | එලවලුද |
| ලෙඩ සුව කරන දිව ඔසු වැනි | පැලෑටිද |
| මේ සැම සැදුනෙ ගෙයි වත්තෙම | නොවෙද |
| | |
| පොල් සහ කිතුල් ගස් සැම වතු වල | සැදුනී |
| කප්රුක් ලෙසින් මේවා ගමෙහි | දිස්වුනී |
| කිරි පැනි ආදියෙන් කිසි අඩුවක් | නොවිනී |
| අගහිඟ කිසිත් කිසිවෙකුටත් නොම | දැනුනී |

### මෙදා ගම

| | |
|---|---|
| ඉඳහිට බලන්නට යනවිට අපේ | ගම |
| දකින්ට ලැබේ හොඳටම වෙනස් | කම |
| අදහා ගන්න බැරි හින්දා වෙනස | මෙම |
| විමසයි මගේ සිත ඒකට කරනු | කිම |
| | |
| උසට උසේ තිබු ගස්නම් දැන් | නැතිය |
| නිලට නිලේ තිබු කෙත් වතු දැන් | අඩුය |
| රුවට රුවේ පිපි වන මල් දැන් | නැතිය |
| බැලු බැලු සැම තැනම දැන්නම් තේ | වතුය |
| | |
| ඇසට පිය දසුන් නැත දැන් | දකින්නට |
| කනට පිය හඬද නැත දැන් | අසනන්ට |
| ගත සිත පිනන අහරද නැත | බුදින්නට |
| තැනක් නොමැත නිසලව ගත | කරන්නට |
| | |
| ගම් පියසේ තිබු සිසිලස දැන් | නැත්තේ |
| ඒ වෙනුවට නුහුරු උනුසුමකුයි | ඇත්තේ |
| ගතට සිතට සැනසුම නම් නෑ | ඇත්තේ |
| නොදනිමි කවුද මේවට වග කිව | යුත්තේ |

## සුදු මැණිකට
ශ්‍යාමා හේවාවිතාරණ මැක්ලෝඩ්

| | |
|---|---|
| පස්වන උපන්දිනය සමරණ සියාරා | මිණිබිරී |
| පොඩ්ඩ පොඩ්ඩ ලොකු වෙනවා කියල | දැනේවී |
| උපන්දිනය සමරණ කොට ළඟ | නොසිටීවී |
| සුබ පතනව මගේ මැණිකට අම්මා | ආච්චී |
| | |
| උපන්දිනය සමරන්නකො යාලුවො | එක්ක |
| කේක් ගෙඩිය කපන්නකෝ අයියත් | එක්ක |
| සුදු මැණිකව මතක් වෙනව පාලුත් | එක්ක |
| ඉක්මණටම ඇවිත් යන්න අයියත් | එක්ක |
| | |
| ළබන වසරේ ඉස්කෝලෙට යන්නට | වේවී |
| එවිට ඔයා ලොකුය කියා අපට | දැනේවී |
| මූණෙ තියෙන තියෙන හුරතල්කම අඩු | නැතිවේවී |
| දඟ වැඩ නම් හරි හරියට තව | වැඩිවේවී |
| | |
| සමරණ අපන් දිනය කිරි පැණියෙන් | ඉතිරේවා |
| ලැබු නව වසරේ ආසිරි මල් | පිපේවා |
| ඉගෙනගන්න වෙර වීරිය තව | වැඩිවේවා |
| තිසරණ සරණ බලයෙන් ඇය | රැකදේවා |

## මං
එරංගා පෙරේරා

ඔබ නිහඬ වෙන කොට
ඉවසා බැරිම තැන
මොකක් හෝ ඇද අරන්
කතා කරන්නේ මං

මං නිහඬ වෙනකොට
ඉවසා බැරිම තැන
රංඩුවක් හෝ ඇද අරන්
කතා කරන්නේ
ඒත් නෙමෙයි ඔබ නම්

## කුටුම්භයෙ සිරකාරි මං
මංගලිකා ප්‍රනාන්දු ලිම්බෑක්

කට වසා විලංගු ලා
හිර කරන් මගේ සිතුවිලි
සවන් යොමනු වෙනුවට ඔබ
කන් අගුල් හිර කරන්

යසට නිදිගත් රැය පුරා
වෙහෙසකර නෙතු අවදියෙන්
සුසුම් පොදි පාකර හරිම්
රිදුම් දෙයි හද පාරමින්

සුළි සුළං වැඩෙනා ලෙසින්
අකුණු සර විනිවිද යමින්
රළු වූ ඔබ ප්‍රේමය තරම්
නෙතට උණු කඳුලක් අරන්

පිනි බිඳක තරමට වගේ
සිත විනිවිද දුටු මගේ
පුදුමයි නුඹට නොදැනුණා
දැනෙ හඬනා සිත මගේ

සෙනෙහස් විලේ පිපි කුසුම්
සුවඳ නෑ පෙරදා තරම්
කුටුම්භේ සිරකාරි වී මං
සිටිම තවමත් ඔබ ළඟින්

## මා දුටු සඳ
ජයසේන කොඩිතුවක්කු

ඇවිත් ඇවිත් ගියත්
හැම රැයකම වගේ
බෙදන් බෙදන් ගියත්
සිසිල ලොවට අගේ

කවුරු කවුරු වුනත්
ඔබ තතු ගැන නොදත්
ලියල කියල ඇතත්
ඒව ඇත්ත නොවේ

සඳක් සඳක් කීවත්
කොහෙද සඳක් එහේ
ඇවිත් ඇවිත් බලත්
පුංචි ළමයි වගේ

දැනුම මිනුම ඇතොත්
ඇත්ත ඔබට පෙනේ
හිරුගෙ එළිය නැතොත්
කොහෙද සඳක් ඉතින්

පුංචි ළමයි වුනත්
රවටනු හොඳ නෑ
ඇත්ත කියල වුනත්
නැළවිය හැකි ළමයි

## වන්නිගම
ගාමිණී දසනායක

කඳු ශිඛර තුරු ලතා
ගංගා ඇළ දොළද
නිහඬ ලෙස කියන්නේ
නුඹ ගැන ද
සොහොයුරාණෙනි,

සත්තෙන්ම නුඹ ගැනය,
අප ද නුඹ දැක නොමැත
නුඹ ද අප දැක නොමැත
නුඹ ගැන අප දන්නේ
මරා දැමූ වග අසා

මිනිසුනට සැබෑ මිනිසුනට
මළ ඳ නොමළේය නුඹ
එනිසාම ආදරණීය
මිනිසානෙනි
නුඹ මාවතේ ඇදෙන
සුව හසක් මිනිස් කැල
සමග.......

මිනිසුනට ජීවතය දෙන්නට
ජීවිතය පුදකල
"සත්‍යපාල වන්නිගම" නුඹට
අප හදවතේ ශෝකය
ශක්තිය බවට හරවා
නව ලොවට යන මඟට.